# සාහිත්‍ය අගැයුම පිළිබඳ ආදිතම ග්‍රීක අදහස් විමසුමක්

කමනී ජයසේකර

The aim of this discussion is to focus on some of the ancient Greek thoughts on literature and it's value. I have concentrated on statements found on the subject prior to the introduction of 'literary criticism' even in it's very first form. Hormer, Hesiod, Theognis, and Sappho are some who have been subject to analysis. Social, political, economical, religious factors as well as the individual temperaments involved in moulding the diverse ideas would be examined while evaluating the atmosphere set forth by them for the birth of literary criticism in the Western World.

## හැඳින්වීම

මෙම ලිපියෙහි අරමුණ තමා සාහිත්‍ය විචාරයක් පිළිබඳ අගැයුමක් කරන්නේය යන අදහසින් තොරව ආදිතම ග්‍රීක සාහිත්‍යධරයන් සාහිත්‍ය පිළිබඳ ව දක්වා ඇති මත කිහිපයක් විමසුමට ලක්කිරීම යි. මේ සඳහා විවිධ සාහිත්‍යධරයින්ගේ නිර්මාණවලින් සාධක උදාහරණ සහිත ව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමි. එසේ කිරීමේ දී එම කවින් විසූ සමාජ, දේශපාලනික හා ආගමික පරිසරය පමණක් නොව ඔවුන්ගේ පෞද්ගලික විශ්වාස හා මතවාද ද ඉදිරිපත් වූ අදහස්වලට බලපා ඇති ආකාරය අවධානයට ලක් කළෙමි.

හෝමර්, හිසියඩ්, තියොග්නිස්, සැපෝ හා සෙනොෆානේස් මෙහි දී විමසුමට ලක්වන සාහිත්‍යධරයින් අතර විශේෂත්වයක් ගනියි. තදුකාලීන ග්‍රීසියෙහි ප්‍රවර්ධනය වූ සාහිත්‍ය විචාරය අඩිතාලමක් නොමැති ව ගොඩනගන ලද්දක් නොවන බව මෙහි දී සනාථ වේ.